# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

CEYLON GOVERNMENT GAZETTE No. 6,489 — FEBRUARY 16, 1912.


## SINHALESE TRANSLATIONS OF NOTIFICATIONS.

[By-laws and Regulations of the Galle Municipal Water Service.]

**මහාබ්‍රිතාන්‍යය සහ අයර්ලන්තයේත් යන එක්සත් රාජධානියේද, මුහුදින් එතර බ්‍රිතාන්‍ය රටවලද ශ්‍රීමත් රාජ්‍යානුශාසක සමයසංරක්‍ෂක පස්වෙනි ජෝර්ජ් රජ්ජුරුවන්වහන්සේගේ නාමයෙන්ය.**

**ලංකාවීපයේ සහ ඊට වසඟ රටවලද ආණ්ඩුකාරධුරන්ධර සෙන්ට් මයිකල් සහ සෙන්ට් ජෝර්ජ් යන අති විශිෂ්ට පඩක්කියේ නයිට් ග්‍රෑන්ඩ්ක්‍රොස්වූ සර් හෙන්රි එඩ්වර්ඩ් මැක්කලම් උතුමාණන්වහන්සේ විසින් දෙවාවදුරණලද**

**ප්‍ර කා ශ ප ත්‍ර ය යි.**

**හෙන්රි මැක්කලම්.**

වර්‍ෂ 1910යේ නෝමර 6යේ ආඥාවේ 109 (1) වගන්තියේ නියමකර තිබෙන්නේ නම් එම ආඥාවේ පංගාර්තු ඉෂ්ටකෙරීම සඳහා ඊට අවශ්‍යයයි හැඟෙන අතුපණත් කලින්කලට සෑදීමට, සෑදුවාට පසු නිශ්ප්‍රභාකෙරීමටද, අළුත්වැඩියාකෙරීමටද, වෙනස්කෙරීමටද, නගර සභාවට පුළුවනු. තවද ඒ පණත්වලට විරුද්ධකරන වැරදිවලට දණ්ඩනවශයෙන් එක වරදකට රුපියල් 50කට වැඩිනොවූ දඩයක්ද, ලියාදැනුම්දීමක් හෝ අවවාදයක් ලැබුවාටපසුත් නොකඩව කරගෙනයන එම වරදට ඒ වරද කරන එක එක දවසට රුපියල් 25කට වැඩිනොවූ දඩයක්ද එම අතුපණත්වලින් නියමකලහැකිය.

තවද එම ආඥාපණතේ 109වෙනි වගන්තියේ 3වෙනි අතුකාණ්ඩයේ නියමකරතිබෙන්නේ කිසිම අතුපණතක්වත් නිෂ්ප්‍රභාකෙරීමක්වත්, අළුත්වැඩියාකෙරීමක්වත්, වෙනස්කෙරීමක්වත්, ලංකේශ්වරයාණෝ කාරක මන්ත්‍රණ සභාවේදී ස්ථිරකරනතුරු කිසිම බලයක් නැත, තවද එවෙනි අතුපණත් ස්ථිරකලපසු ඉංග්‍රීසි භාෂාවෙන්ද, සිංහලෙන් හා දෙමළෙන්ද ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධකරනවා ඇත. එමනිසා එම ආඥාපණතේ 109වෙනි වගන්තියේ 4වෙනි අතුවගන්තියේ පංගාර්තුවලට යටත්ව මෙම පණත් මෙම ආඥාපණතේ ප්‍රකාරම නියමකලාමෙන්ම බලය ඇතුවා සහ නීතියට එකඟව බන්දවන බලයද තිබේ.

තවද මෙහි ඇඩ්ලිපත්‍රයේ අන්තර්ගත අතුපණත් වර්‍ෂ 1910යේ නෝමර 6යේ ආඥාවේ ප්‍රකාර 110වෙනි වගන්තියේ 4වෙනි අතුවගන්තියේ පංගාර්තු යට ගාල්ලේ නගර සභාව විසින් සාදනලදි. තවද එම ආඥාපණතේ 109වෙනි වගන්තියේ 3වෙනි අතු වගන්තිය යට එම පණත් ලංකේශ්වරයාණන් විසින් කාරක මන්ත්‍රණ සභාවේදී ස්ථිරකරණලදි.

දැන් එම සෙයින් සියලුදෙනා මෙයින් දැනගනිත්වා එම ලංකේශ්වරයාණෝ මෙහි ඇඩ්ලිහි අන්තර්ගත අතුපණත් මෙයින් ප්‍රකාශකරනවා සහ මෙහි සඳහන් දිනේ සිට ඒවායේ බලය පවතින බවද මෙයින් සඳහන් කරන්නෙමු.

———————— දෙහුලැබුවේ ———————————— මෙම ලංකාවීපයේදී අප ස්වාමින්වහන්සේගේ වරුෂයෙන් එක්වාදහස් නමසිය දොළොස් ජනවාරි මස විසිදෙවෙනි දින කොළඹ දිය.

ලංකේශ්වරයාණන්ගේ අණපරිද්දෙන්,

හියු ක්ලිෆර්ඩ්,
මහලේකම්තාරිස් වමහ.

දෙවියෝ රජ්ජුරුවන් රකිත්වා.

---

### ඇඩ්ලි.

**ගාල්ල නගරිකයේ ජලසල්පාදනය සම්බන්ධ අතුපණත් සහ රෙගුලාසින්ය.**

1\. වර්‍ෂ 1891කේ ගාල්ලේ වතුර කර්මාන්ත සම්බන්දණය ආඥාපණතේ" ප්‍රකාර නගර සභාවට ලැබී තිබෙන බලයේ හැටියට වතුර බදු නියම කෙරීමට සහ ගෙවීමට බලකෙරීමටද, මේ රෙගුලාසිවල හැටියට අයකලහැකි මුදල්ද "වර්‍ෂ 1910යේ නගර සභා ආඥාපණතේ" හෝ දැනට තිබෙන හෝ මින්මතුවට පන වන්ට යෙදෙන ආඥාපණත් ප්‍රකාර අයකරණුලැබේ. *(වතුරබදු අය කරණ ක්‍රමය.)*

2\. උවමනාවල් ප්‍රකාර මෙහි පහත සඳහන්කරන්ට යෙදෙන බලය සහ යුතුකම්කෙරීම සඳහා සෑහෙන අය නගර සභාව විසින් පත්කරනුලැබේ. මේ කියනලද බල සහ ඔවුන්පිට පවරාතිබෙන යුතුකම් ඉෂ්ටකෙරීමේදී, ඔවුන් නගර සභාපතිතුමාගේ අණට සහ නියමවලට යටත්වා සහ ලංකාවේ දණ්ඩනීතියේද, වර්‍ෂ 1910යේ අංක 6යේ ආඥාපණතේ 68වේ වගන්තියේ සඳහන්වී අදහස්වෙන හැටියට ඔවුන් "මහජනයාගේ වැඩකරුවන්" මෙන් බාරගනුලැබේ. *(වතුරකර්මාන්ත මුලාදෑනි පත්කෙරීමට සභාවට තිබෙන බලය.)*

3\. මේ කියනලද මුලාදෑනීන්ට සභාවට යුතුයයි හැඟියන වැටුප් හෝ වැඩිමනත් ගෙවිලි දෙනවා ඇත. *(වැටුප් ආදිය ගැනයි.)*

4\. වතුර බදු අයකෙරීමේදිද, වතුර සැපයීමේදිද, වතුර කර්මාන්ත පැවැත්වීමේදිද, යන වියදම් සභාව විසින් නාගරික අරමුදලෙන් ගෙවනුලැබේ. වැටුප්, කුලිගෙවීම් පිංපඩි සහ වෙනත් වැඩකාංඩායමට ගෙවියයුතු මුදල්ද ඉහතකී ප්‍රකාර ගෙවනවාඇත. *(වතුරකර්මාන්ත පැවැත්වීමේදී යන වියදම් ආදිය ගෙවීම.)*

**පොලිස් මායිම් තුළ වතුර සැපයීමට සභාවට තිබෙන යුතුකම.**

5. ගාළු නගරයතුළ අළුත්වැඩියාකරණලද පොලිස් මායිම්තුළ බිමට වතුර සභාව සපයා දෙනවාඇත. මේ සඳහා සභාව විසින් නලදැමීම, තාන්කි, පෙරෙනතාන්කි, දියමගවල්, ජලාශවල් සහ වෙනත් කර්මාන්ත කරවනුලැබේ.

තවද ඒ ඒ වීදිවල වතුරකනු, ජලාශ හෝ පෝම්ප මේ මායිම්තුළ පදිංචිකාරයින්ගේ ගෘහස්ථ උවමනාවලට ප්‍රයෝජනවන පිණිස නොමිලයේ සවිකරනුලැබේ. සපයාදෙන වතුර මනුෂ්‍ය ප්‍රයෝජනයට සෑමවිටම සුදුසුව තිබෙන අන්දමටද, මුළු අවුරුද්දතුළම දිගටම නොවලක්වා වතුර සැපයීමටද, හැකි පමණින් සෑහෙන විධිවිධාන සැලැස්වීම සභාවේ යුක්තියක්වේ.

**වතුරකර්මාන්ත නගර සභාවට හිමි බව.**

6. සියලුම ප්‍රසිද්ධ තාන්කි, ජලාශ, සාදනලද තටාක, වතුරකනු, දියමග, ළිං, නල, පොකුනු සහ මේ රෙගුලාසි පනවනකල තිබෙන වෙනත් ජල කර්මාන්තද, මින්පසු සාදන, දමන හෝ ගොඩනගවන සියළු ගොඩනැගිලිද, කර්මාන්තද, ජලකර්මාන්තවලට අයිති වෙනත් සියළුදේවල්ද සභාවට හිමිය.

**ආණ්ඩුවට වතුර සැපයීම.**

7. පොලිස් මායිම්තුළ ලංකාවේ දුම්රථ පාරට පාවිච්චිය පිණිස නොමිලයේ වතුර සැපයීම සභාව විසින් කරනුලැබේ. ලංකාණ්ඩුකාරතුමා විසින් ලියා නියමකරන ස්ථානවල මේ කියනලද වතුර සැපයීම කරනවා ඇත.

**පුද්ගලික වතුර සැපයීම කෙරීමට සභාවට තිබෙන බලය.**

8. ගේක අයිතිකාරයෙක් හෝ පදිංචි කාරයෙක් ගෘහස්ථ ප්‍රයෝජනය පිණිස පුද්ගලික වතුර සැපයීමක් ඉල්ලන්නේ නම් සභාව විසින් ඒ ඒ ප්‍රමාණයට සහ අන්දමට යුතුයයි හැඟෙන ප්‍රමාණයට සපයනුලැබේ. මෙසේ ඉල්ලීමක් කළේනම් වීදි නලේ සමග උවමනා යාකෙරීමක් ඒ ස්ථානය සමග කරනවා ඇත. නමුත් ඒ යාකෙරීමට සහ තවත් මනත්වැඩි නල ආදියටද, සවිකෙරීම්වලටද යන වියහියදම් ගේ හිමියා හෝ පදින්චි කාරයා දැරියයුතුයි.

මේ ඉහතකී යාකෙරීම් සිද්ධකෙරීමේදී කර්මාන්ත සුපිරින්ටැන්ඩන්ට් යටතේ නාගරික වැඩකරුවන් ලවා, ඒ ඉල්ලුම්කාරයාගේ වියදමෙන් කරවනවා ඇත, මේ වැඩය පටන්ගන්ට ප්‍රථම ඊට නියමකළ වියදම සභා අරමුදලට ගෙවියයුතුයි.

උවමනාකරන නල සහ සවිකෙරීම් සභාපතිතැනගෙන් බලයලත් අය විසින් දමා සවිකරනවා ඇත. තවද කර්මාන්ත සුපිරින්ටැන්ඩන්ට්තැන ඒවා පරීක්ෂාකර හොඳයයි නියමකරණතුරු ඒවා පාවිච්චිකළ නොහැකිය.

**වීදිනල සමග යාකෙරීම් නොවන්නාවූ වෙනත් වැඩ කෙරීම.**

9. වීදිනල සහ වීදිමායිම අතරෙන් වතුර ඉල්ලාතිබෙන ස්ථානයත් සමග හැකි පහසු අන්දමින් කළ හැකි යාකෙරීම්ද, මතුකරන අළුත්වැඩියාකෙරීම්ද, දික්කෙරීම්ද, මේ සමග තිබෙන පැඩුල්පත්‍රයේ ප්‍රකාරවා සහ ව්‍යවස්ථාදායක මන්ත්‍රණසභාවේ සම්මතය ඇතුව ලංකේශ්වරයානන්ගේ කැමැත්තපිට කලින්කලට නගර සභාව විසින් නියමකරණ රෙගුලාසි ප්‍රකාර සභාපතිතුමාගේ කැමැත්ත ඇතුව නියමකරනලද අන ප්‍රකාර ගේහිමියා හෝ පදිංචිකාරයා විසින් හෝ සභාපතිතුමා විසින් කරනුලැබේ.

**වතුර කර්මාන්ත නඩත්තුව.**

10. සියලුම ප්‍රසිද්ධ තාන්කි, ජලාශ, තටාක, ළිං, වතුරමාගී, බිංගෙවල්, නල, ජලමල් සහ මේ රෙගුලාසිවලින් සභාවට හිමිවූ වතුර සැපයීම් වැඩ සභාව විසින් නඩත්තුකරනවා සහ සපයාදෙනවාත් ඇර මින් මතුවට මේ සඳහා සභාව විසින් තනවන සියලු වැඩද එසේම නඩත්තුකරණවා ඇත.

**පෙරීම්වැඩ සහ වෙනත් කර්මාන්ත කැනීමේ බලය සභාවට අයිති බව.**

11. ගාලු පොලිස් මායිම්තුළ නගරවාසීන්ගේ ප්‍රයෝජනය පිණිස සභාව විසින් කලින්කලට පෙරන යනනු, තාන්කි, ජලමාගී සහ වෙනත් බිමට සුදුසු වතුර ගෙනත්දීමට උවමනා වැඩ කෙරීමට සභාවට බලය තිබේ,

**වීදි ආදිය හෑරීමට සහ පුද්ගලික ඉඩම්වලට ඇතුල්වීමට සභාවට බලේ තිබෙන බව.**

12. (1) වතුර සැපයීම සඳහා නල දැමීමේදී සභාවට උවමනාවුනිනම්, එම නල වීදියක් හෝ වීදියක් වශයෙන් අදහස්කළ හෝ සාදපු ඉඩමකින් දිගේ හෝ හරහා හෝ යටින්ද, කොයිම ගොඩනැගිල්ලක් ගබඩාවයක්, බෝක්කුවක් මැදින්ද, කොයිම ඉඩමක්තුළට හෝ මැදින් හෝ, යටින් එම නල දැමීමට සභාවට පුළුවන. මෙයාකාර කාරණයකදී නගර සභාව එසේකරන්ට යන බව එම ඉඩම් හෝ ගෙවල් හිමියාට දැනුම්දෙනවා ඇත. තවද වැඩය නිමවූ පසු ගේ හිමියාට මේ සඳහා යම් අලාභහානියක් වූනිනම් ඊට සෑහෙන ගෙවීමක් වන්දිවශයෙන් ගෙවනවා ඇත.

මේ සෑම ප්‍රස්තාවලදීම සභාව විසින් එසේකරන්ට යන බව එම ඉඩම් හිමියාට දැනුම්දෙනු ලැබේ. තවද මේ කර්මාන්තය ඉවරවූ පසු මේ වැඩකෙරීමේදී යම් අලාභහානියක් ඒ ඉඩම් හිමියාට මේ අංකයේ සඳහන්වෙන වැඩ නිසා උනිනම් කල්පනාවට යුතුවූ වන්දිගෙවීමක් සභාව විසින් කරනවා ඇත.

**සංවත්සර මුදල් ගෙවීම සභා අරමුදලෙන් බව සහ එම මුදල් අයබදු ආදායම ආදියෙන් ගතයුතු බව.**

13. ගාල්ලේ ජලකර්මාන්ත අරභයා දැනට වෙලා තිබෙන සියලු වියදම් ගෙවීමද නාගරික අරමුදලෙන් වියයුතුයි. තවද ඒ අයබදු ආදායම සභාවට අයිති දේපලවලට අයකළයුතුයි, මේ කියනලද කාරණ වර්ෂ 1910ශේ නෝමර 6ශේ ආඥාපණතට හෝ වෙන අළුත්වැඩියාකරණ ආඥාවලටවත් විරුද්ධ නොවෙයි,

**කොටසයක්, ගෙයක් හෝ ඉඩමක් බදු නොගෙවා සිටීමට අත හරින්ට සභාවට තිබෙන බලය.**

14. ව්‍යවස්ථාදායක මන්ත්‍රණසභාවේ සම්මතය ඇතුව ලංකේශ්වරයානන්ගේ කැමැත්ත පිට කලින් කලට ආණ්ඩුවේ ගැසැට්පත්‍රයේ දැනුන්දීමෙන් නගර සභාව විසින් නගරයේ පලාතක් හෝ පලාතකින් කොටසක් හෝ බදු නොගෙවා සිටීමට අත්හැරිය හැකිය. ඒ කැමැත්ත නැතුවත් කොයිම ගෙයක්වත් ඉඩමක් හෝ පදිංචි ස්ථානයක් වතුරලැබීමට සාමාන්‍ය පහසුකම් නැතිනම් ගාල්ලේ ජලකර්මාන්ත ආඥාපණතේ හෝ එම පණතේ ප්‍රකාර වතුර සැපයීම සඳහා ගෙවන්ට නියමවූ එක් සම්බන්ධ ගණන් ප්‍රමාණයට අඩු කෙරීමක් කිරීමට සභාවට බලය තිබෙනවා සහ එමාකාර දැන්වීම්වලින් කලින්කලට එම වෙනස්කෙරීම් අවලංගුකරන්ටද පුළුවන.

**ගෘහස්ථ ප්‍රයෝජන වලට නුවූ වෙනත් සැපයීම් වලදී වතුරවල මිල.**

15. ගෘහස්ථ ප්‍රයෝජන නුවූ වෙනත් උවමනාවලට සපයන වතුරට අයකෙරීම් මෙසේය.

(1) මුළු වශයෙන් හෝ අඩි වශයෙන් පාවිච්චිකරන්නාවූ:—

(a) යම් වෙලඳාමක් හෝ කර්මාන්ත සෑදීමක් කරණ එකට පාවිච්චිකරණ වතුරට ගැලොම් 1,000ක් රුපියල් 1ක බැගින්ද,

(b) හෝටලයක් පුද්ගලික භෝජනශාලාවක්, සංග්‍රහශාලාවක්, නවාතැන් ස්ථානයක් යන මේවාට පාවිච්චිකරණ වතුරට ගැලොම් 1,000ක් ශත 50ක් බැගින්ද,

(c) ප්‍රසිද්ධ ස්නානය කරණ ස්ථානයක්මෙන් පාවිච්චිකරණ ඉඩමකට වතුර ගැලොන් 1,000ක් ශත 50ක් බැගින්ද,

(d) විකිනීමට හෝ බදුදීමට අශ්වයන්, ගවයන් වාහන ආදිය තබාතිබෙන ස්ථානයකට ගැලොම් 1,000ක් ශත 50 බැගින්ද,

(2) මෙහි පහත කියණ ප්‍රකාර වතුර පාවිච්චිකරණ ස්ථානවලට :—

(a) පිහන තාන්කිවලට ගැලොන් 1,000ක් ශත 50යි.

(b) කිසිම වෙලහෙළඳාමක් සම්බන්ධ නොවූ ජලමල්වලට හෝ "හයිඩ්‍රෝලික් මෝටෝර්ස්" වලට ගැලොන් 1,000 ශත 50යි.

(c) මිදුල් හෝ වතුවලට දැමට ගැලොන් 1,000 ශත 50යි.

(d) ගෙවල් තනන හෝ පාර සාදන වැඩට ගැලොන් 1,000ක් රුපියල් 1යි.

(e) නැව්වලට සපයන වතුරට ගැලොන් 1,000 රුපියල් 3·50.

*පුද්ගලික සැපයීම් කරදීමට සභාවට පුලුවන් බව.*

16. ගේ හිමියෙකුගේ හෝ පදිංචිකාරයෙකුගේ ඉල්ලීම පිට ගෘහසථ පාවිච්චිය පිණිස වතුර සැපයීමටද, එම සැපයීම් නලවල මිම්මක් සවිකෙරීමටද සභාවට බලය තිබේ. වතුර සැපයීම ගැණ සහ වැඩිමනත් සැපයීමට අයකරණ ගණන් පිළිවෙලද සඳහන් වන්නාවූ 20වෙනි වගන්තියේ නියමවල් මේ වගන්තියටත් නියමය.

*අයිතුවෙන් කරන සියලුම සැපයීම් වලදී අළුත් මිම් සවිකල යුතු බව සහ වැඩිමනත් වතුර සැපයීමට මුදල් අයකල යුතු බවත්.*

පුද්ගලික සැපයීමකට ඉඩහැරීමේදී වීදි නලය සමග සහ ඉඩම සමග කරණ යාකෙරීම්ද, ඊට උවමනා නල සවිකිරීම්, සැපයීම්, දැමීම් සහ හයිකෙරීම් කොමිෂනර සුපරින්ටැන්ඩන් යටතේ නාගරික වැඩකරුවන්ලවා ඉල්ලුම්කාරයාගේ වියදමින් කළ යුතුයි. මේ වැඩ පටන්ගන්ට ප්‍රථම ඊට යාහුතු හක්සේරුකල ගාසතුව නාගරීක අරමුදලට ගෙවිය යුතුයි. තවද මතුවට කෙරෙන අළුත්වැඩියාවල්, දිගීකෙරීම්, වෙනස්කෙරීම්, සියල්ල ගේ හිමියාගේ හෝ පදිංචිකාරයාගේ වියදමෙන් කළ යුතුයි.

*නලආදී සවිකිරීම් නය උදෙසා අල්ලන්ට බැරි බව.*

අයිතිකාරයාගේ හෝ පදිංචිකාරයාගේ කිසිම නයක් උදෙසා යාකරනලද නලවත්, සැපයීම් නලවත්, ඊට අයිති කොයිම සවිකෙරීම්වත් අල්ලන්ට බැරිය.

*යම් ඉඩමකට පැමිණ සෝදිසි කෙරීමට සභාපතිතැනට බලේ තිබෙනබව.*

17. උදේ 8වේ සිට සවස 5 වෙනතුරු කොයිම වේලාවකදී නමුත් සභාපතිතැන මේ ආඥාපණත ප්‍රකාර වතුර සපයන කොයිම ස්ථානයකට නමුත් පැයකට පෙර දැනුම්දීමෙන් පැමිණ එහි තිබෙන නල සවිකෙරීම් ආදියද වතුර අපතේ අදිනවාද, අයුතු පාවිච්චියක් කරනවාද යන්නද සෝදිසිකල හැකිය. සභාපතිතැනට හෝ ඔහු විසින් නියමකරණලද අයට යම් සෑහෙන කරුනක් නැතුව ඉහත කියනලද ගොඩනැගිලිවලට හෝ ඉඩම්වලට සෝදිසිය පිණිස ඇතුල්වෙන්ට ඉඩ ගේ හිමියා හෝ පදිංචිකාරයා නුදුන්නේ නම්, සභාපතිතැන විසින් ඒ ගොඩනැගිල්ලට හෝ ඉඩමට වතුර සැපයීම් තහනම්කරන්ට පුළුවන.

*වතුර අපතේ යන්නේනම් සැපයීම නැවැත් වීමට සභාපති තැනට බලය තිබේ.*

18. දියනලයකින් හෝ දියගන්න නලයකින් හෝ මිම්මකින් හෝ වෙනත් යම් සවිකෙරීම්වලින් හෝ වතුර අපතේ යන්නේනම්, සභාපතිතුමාට එකපාරටම වතුරදීම නැවැත්විය හැකිවා සහ ඒ වැරුදි හරිගස්වන තුරු මහනල සමග යාකෙරීම් නවත්වනවා ඇත.

*වතුර කාන්දුවීම රපෝර්තු කලයුතු බව.*

යම් නලයකින් හෝ වතුර පෙට්ටියකින් හෝ වෙනත් සවිකෙරීමකින් කොයිම ගෙදරක හෝ ස්ථානයක කාන්දුවීමක් සිදුවන්නේනම් ඒ ගෙයි හිමියා හෝ පදිංචිකාරයා විසින් පැය 24ක් ඇතුලත ඒ බව සෙක්‍රතාරිස් තුමාට දැනුම්දී සිටිය යුතුයි.

*නල ආදිය අළුත්වැඩියා නොකර අත් හැරීමේදී ලැබෙන දඬුවම.*

19. ජලකම්ානතවලින් වතුර සැපයීම ලබන කෙනෙක් කැමැත්තෙන් හෝ නොසැලකිලිකමින් නලයක්, නල දෙරක්, ඇබයක් වතුර පෙට්ටියක්, වතුර කාමරයක් හෝ වෙනත් මිට අයත් උපකරණයක් අළුත්වැඩියා නොකලා හෝ නොකරවා පැහැර ඇරියොත්, සපයනලද වතුර අපතේ හැරියා හෝ වැරුදි පාවිච්චියක් කලා හෝ ඔනෑවාට වඩා පාවිච්චිකලා හෝ දූෂ්‍යකලා හෝ දූෂ්‍ය වාතය හෝ කැත ද්‍රව්‍යයක් නල තුලට ඇතුල්වෙන්ට හැරියේ නම්, ඒ අය වරදකට යටත් වේ, මේ වරදට ගැසිය හැකි දඩය රුපියල් 50කට වැඩි නොවේ.

*වතුරෙන් වැරුදි පාවිච්චියක් කරන්නේනම්, මිම්මක් සවිකර වැඩිමනත් පාවිච්චියට මුදල් අයකරණ බව.*

20. යම් ස්ථානයකට නාගරික ජලකම්ානතවලින් ගන්නා වතුර ඒ පවුලේ අය හැර වෙනත් උදවිය පාවිච්චිකරන බව සභාවට දැනගන්ට ලැබුනවිටක හෝ එම වතුර අපතේ හරිනවා හෝ, වැරදි පාවිච්චියක් කරනවා හෝ, උවමනාවට වැඩි පාවිච්චියක් කරනවා හෝ දැනගන්ට ලැබුනිනම් සභාව විසින් ඒ ස්ථානයේ මිම්මක් සවිකර ගේ හිමියාගෙන් හෝ පදිංචිකාරයාගෙන් කාර්තුවකට ගැලොම් 3,000කට රුපියල බැගින් නියමව තිබෙන ගණනට වැඩිය පාවිච්චිකල වතුර ප්‍රමාණයට ගැලොම් දහට රුපියල බැගින් ගෙවිය යුතුයි.

*නල ආදිය රෙපෙරේරු කරවීමට සභාපති තැනට බලය තිබෙන බව සහ ඊට යන වියදම් අයකරන්ට තිබෙන බලය.*

21. සභාපතිතුමා හෝ ඔහුගෙන් බලයලත් අයෙක් යම් නලයක්, නලදෙරක් ඇබයක්, දිය පෙට්ටියක් වතුර කාමරයක් හෝ මිට අයත් කොයිම උපකරනයක්වත් වතුර අපතේ නැරීම සඳහා රෙපෙරේරුකරවා සභාපතිතුමාගේ අනහන ඇතුව ඊට ගිය වියහියදම් සියල්ල ගේ හිමියා හෝ පදිංචිකාරයා විසින් ගෙවිය යුතුයි. තවද එම මුදල 1910යේ නාගරීක ආඥාපණතේ ප්‍රකාර හෝ මතුවට අළුත්වැඩියා කරණ කොයිම පණතක් ප්‍රකාර අය වියයුතු බද්දක් මෙන් අයකරනවා ඇත, අයකල පසු සභාව විසින් නියමකල පරිදි ගණන් තබනවා ඇත.

*වතුරෙන් වැරුදි පාවිච්චියක් කෙරීම.*

22. කොයිම අයෙක් නමුත්—

(a) තමන්ගේ ගෘහසථ ප්‍රයෝජනයට හැර වෙනු පාවිච්චියකට වතුර සැපයීමක් නැතුව, ඒ පාවිච්චි සඳහා පෙරකී වතුර පාවිච්චිකරන්නේ නම්, හෝ,

(b) තමන්ගේ ගෘහසථ ප්‍රයෝජනයට නුවූ වෙන ප්‍රයෝජනයකට ලබන වතුර ඒ අදහසට ඇර වෙනත් උවමනාවලට පාවිච්චිකරන්නේ නම්,

*දණ්ඩනය.*

ඔහු වරදකට යටත්වේ. ඒ වරදට රුපියල් 20කට වැඩිනොවූ දඩයකට යටවිය යුතු සහ ඒ යටවීම ඔහු විසින් වැරදි පාවිච්චියට ගත් වතුරවලට මුදලක් අයකෙරීමට තිබෙන බලයට බාධාවක් නොවේය.

*සභාපති තැනගේ කැමැත්තනැතුව යාකරපු නලයකට හෝ වෙනත් නලයකට, නලයක් හෝ යම් වෙන උපකරණයක් සවිකරන අයට දඬුවම.*

23. ජලකම්ානතවලින් වතුර සැපයීම ලබන ගේ හිමියෙක් හෝ පදිංචිකාරයෙක් හෝ වතුර පාවිච්චි කරන්නෙක් හෝ වෙන කොයිම අයෙකු හෝ ජලකම්ානත නලයකට හෝ එම නල සභාවට අයිතිඒවා හෝ පුද්ගලික අයිතිකම් ඇති ඒවා හෝ උනත්, සභාපතිතැනගේ කැමැත්ත නැතුව නලයක් හෝ වෙන යම් උපකරනයක් සවිකලා හෝ කෙරෙව්වාද, මේ වගන්තියේ සඳහන් ගරකුලාසිවලට විරුඬව වෙන මොනම ක්‍රියාවක්හරි යම් අයෙක් කරන්නේද, ඔහු ඒ කරන වැරුද්දට රුපියල් 50කට වැඩිනොවූ දඩයකට යටත්ය. තවද ඔහු විසින් කරණලද වැරුද්දේ අලාභහානි හෝ අපතේ අරිනලද හෝ වැරදි පාවිච්චිකල හෝ වැඩිමනත් පාවිච්චිකල වතුරවලට අයකර ගතහැකි ගාසතුවට මේ දඩය විරුඬනොවේ,

*ගෘහසථ ප්‍රයෝජනයට නුවූ වෙනත් සැපයීම් වලට අයකරන ගණන්.*

24. ගෘහසථ ප්‍රයෝජනයට නුවූ වෙනත් යම් පාවිච්චියට ගන්නා වතුර නලවලට මිම්මක් සවිකෙරීමට සභාවට බලය තිබේ. 15වෙනි වගන්තියේ සඳහන් ප්‍රකාර පාවිච්චිකරන වතුරේ ප්‍රමාණයට මුදල් අයකරනවා ඇත. 1910යේ නෝම්බර 6යේ ආඥාපණතේ ප්‍රකාර ඉඩමකට අවුරුද්දකට වටිනාකම නියමකල ගනනින් හතරෙන් තුන් පංගුවක් මේ ඉහතකී අයකරන මුදලෙන් අඩුකරනවා ඇත.

*පොරොන්දුවකට බැඳී කරන සැපයීම.*

නාගරීක සභාපතිතුමා සමග මෙහි යාකර තිබෙන ෂැඩුල් පත්‍රයේ A ෆෝර්මයේ ප්‍රකාර පොරොන්දුවකට බැඳීමෙන් උවමනා කෙනෙකුට ගෘහසථ ප්‍රයෝජනයට නුවූ වෙනත් උවමනාවලට ඕනෑවූ වතුර සැපයීම ලබාගත හැකිය.

*වතුර සැපයීම ලබන ස්ථානෙන් කින් තවත් අයෙකුට වතුර සැපයීමට හෝ එම ඉඩමෙන් ගෙනයාමට ඉඩහරිනවාට දෙන දඬුවම.*

25. මේ ආඥාපණතේ ප්‍රකාර වතුර සැපයීම ලබන ගේ හිමියෙක් හෝ පදිංචිකාරයෙක් වෙන කොයිම කෙනෙකුටවත් වතුර සපයන්නේනම්, නලයකින් හෝ වතුර පෙට්ටියකින් කැමැත්තෙන්ම ගැනීමට ඉඩ හරින්නේනම් ඔහු වරදක් කලා වේ. ඊට දඬුවම් වශයෙන් රුපියල් 50කට වැඩිනොවූ දඩයකට යටවිය යුතුයි. තවද ගින්නක් නිවීම සඳහා හෝ ඒ වතුර ඉල්ලන අයත් නාගරික වතුර සැපයීම ලබන අයෙකු හෝ තමාගේ වැරැද්දක් නැතුව වතුර සැපයීම තම ඉඩමට නවත්වනුලැබූ අයෙකු හෝ වූනිනම් එබඳු කෙනෙකුට සැපයීම හෝ ගෙනයාමට ඉඩහැරීම වැරැදි නොවන්නේය.

*ජලාශ යනාදිය වලින් වතුර ගන්නා හෝ පාවිච්චිකරන නාට දෙන දඬුවම.*

26. වතුරකම්මානතයට අයිති ජලාශයකින් හෝ ජලමගකින් හෝ නලයකින් හෝ මේ ඉහතකියනලද කම්මානතවලට යාකර තිබෙන නලයකින් හෝ ජලකම්මානතය සඳහා සපයා තිබෙන වතුර පෙට්ටියකින් හෝ මහජනයාගේ පාවිච්චිය සඳහා නුවූ පාවිච්චියට සපයනලද වතුරකින් යම් කෙනෙක් අයුතු ලෙස වතුරගන්නේ නම්, එසේ ගෙන පාවිච්චිකරන්නේනම් ඔහුට ඒ වැරැද්දට රුපියල් 50කට වැඩිනොවූද දඩයක් නියමය.

*ජලකම්මානතවලට අයිති යම් කම්මානතයක් යනාදියක් නාසතිකෙරීමේදී හෝ වතුර අපතේ හැරීයාට හෝ දෙන දඬුවම.*

27. නාගරික සභාපතිතැනගේ අවසරයක් නොමැතිව කැමැත්තෙන් හෝ සැලකිලි නැතිකමින් අගුලක්, ජලයන්ත්‍රයක්, නල ඉපියක්, නලයක්, ඊට සම්බන්ධ වැඩක් හෝ යන්ත්‍රයක් කැඩුවා, ආන්තරාකලා, ඇරියා, වැසුවා, අයුතුලෙස අතපතගෑවා හෝ කලාද, ජලකම්මානතයට අයිති ජලාශයකින් වතුර පැහැර හැරියා හෝ කැමැත්තෙන් කරන ක්‍රියාවක් උදෙසා වතුර අපතේයන්ට හැරියා හෝ ජලසැපයීමට බාධාවක් කලාද එසේකරන අය වරදක්කාලා වේ. ඊට රුපියල් 50කට වැඩිනොවූ දඩයකට ඔහු යටවිය යුතුයි.

*සමහර ප්‍රසංගවලදී සැපයීම කපාහැරීමට සභාපතිතුමාට තිබෙන බලය.*

28. සභාපතිතුමාට ඕනෑවිටක ජලකම්මානත සමග සම්පූර්ණයෙන් හෝ අඩ සම්බන්ධකමක් ඇති නලයක් හෝ ජලමලක හෝ වෙනත් කම්මානතයක වතුර අඩුකෙරීමටද, නැවැත්වීමටද, වැසීමටද, වෙන අතකට හැරවීමටද පුළුවන. සභාපතිතුමා යුතුයයි සිතන ඕනෑවිටක මෙසේ කෙරීමේදී වතුර බද්දටවත්, මිම්බද්දටවත්, වෙනත් අයවියයුතු මුදලකටවත් මේ රෙකුලාසිවල සඳහන් යම් කරුණුවලටවත් විරුඬයක්වත් හානියක්වත් මෙයින් නැත.

(1) ජලකම්මානතවල අඩංගු වතුර සැපයීම සභාපතිතුමාගේ කල්පනාවේ හැටියට මදිය කියා සිතෙනවානම්.

(2) වතුර වැඩ දිගු කෙරීමේදී, වෙනස්කෙරීමේදී, හෝ අළුත්වැඩියාකෙරීමේදී, හෝ යාකෙරීමේදිද,

(3) ප්‍රසිඬ වතුර කන්ඩුවක් අනතුරුවී හෝ එහි තුල වතුර දූෂ්‍යවී හෝ අපතේ යනවානම්.

(4) මේ පරිච්ඡේදයේ කාරනා ප්‍රකාර, සෑදීමක්, වෙනස්කෙරීමක්, දෙවනු හරිගැස්සීමක් ගේ හිමියා විසින් නොකර පැහැර ඇරියේනම්.

(5) මේ රෙකුලාසි ප්‍රකාර ගෙවියයුතු ගෙවිලි නොගෙවා ගේ හිමියා හෝ පදිංචිකාරයා පැහැරඇරියේනම්, තවද ඒ නොගෙවා තිබෙන කාලයතුලේදිද, ගේ හිමියාගේ ඉල්ලීම පිටද,

(6) ගින්නක් හටගැනීමේදිද.

(7) මොනම ප්‍රසිඬ ජලමලක, මිම්මක, සැපයීමක අලාබහානියක්, අපතේ ඇරීමක්, දූෂ්‍යකෙරීමක්, වැරදි පාවිච්චියක් සඳහා මේ පරිච්ඡේදයේ කරුණුවලට විරුඬව යමක් කෙරීමක් හෝ නොකර පැහැරඇරීමක් කලෝතින්ය.

*වතුර ආදිය දූෂ්‍යකෙරීමේදී ලැබියහැකි දඬුවම.*

29. මෙහි පහත සඳහන්කරන්ට යෙදෙන මොනම වැරැද්දක්වත් කරන අයෙකුට ඒ එක එක වැරැද්දට රුපියල් 50කට වැඩිනොවූ දඩයක් ගසනුලැබේ.

(*a*) විදිවල, මන්මාවත්වල, ප්‍රසිඬ ස්ථානාදියේ සභාව විසින් දැනට තනවාතිබෙන හෝ මතුවට තනවන්ට යෙදෙන මොනම ජලාශයක්, වතුර කන්ඩුවක්, ජලමලක්, ජලපෙට්ටියක්, නලයක් හෝ වෙනත් ජලකම්මානතයක් ලඟ හෝ කිට්ටුව තම ශරීරාවයවයන් සේදීමක් හෝ නෑමක් ගවයෙක්, අශ්වයෙක්, බල්ලෙක් හෝ වෙන මොනම සතෙක් හරි වාහනයක්, ඇඳුම්පැලඳුමක්, භාජනයක්වත් සේදීම තහනම්ය.

(*b*) මොනම කැතකුනක්, දූෂ්‍යදෙයක්, මේ ඉහත කියනලද ජලකම්මානතයකටවත්, ඒ සම්බන්ධ දියපාරකටවත්, ජලාශයකටවත්, ජලයන්ත්‍රයකටවත්, මතුපිට පෙට්ටියකටවත්, විසිකෙරීම සහ මොනම රෙද්දක්වත්, ලෝමවත්, සම්වත්, සතුන්ගේ හම්වත්, රෙදිවත් හෝ වෙන මොනමදෙයක්වත් සේදීම තහනම්ය.

(*c*) ජලකම්මානතවලට හෝ ඊට අයත් ගොඩනැගිලිවලට හෝ ඉඩම්වලට හෝ ජල සැපයීමට අඳුර ඉඩම්වලට තුල්වීම තහනම්ය.

(*d*) දියමගක්වත්, ජලාශයක්වත්, වතුරපෙට්ටියක්වත්, ලිඳක්වත්, ජලමලක්වත්, වතුරකන්ඩුවක්වත් හෝ ජලසැපයීමට අඳුලවෙන මොනදෙයක් කැඩීම හෝ ආන්තරාකෙරීම තහනම්ය.

(*e*) ඔහුට අයිති වලක, කාණුවක, ධූමයන්ත්‍රයක, බොයිලේරුවක හෝ වෙනත් ඔහුට අයිති යම් වතුරක්වත් සභාවට අයත් ජලකම්මානතයකට හෝ ජලාශයකට හෝ ජලමගකට හෝ දියපාරකට දුවන්ට හෝ එන්ට සැලැස්වීම සහ ජලකම්මානතයට අයත් වතුර දූෂ්‍යවීමට නරක්වීමට හෝ කුණුවීම මොනතරමක්වත් සලස්වන ක්‍රියාවක්වත් කෙරීම තහනම්ය.

තවද කරන වැරැද්ද ගැන සභාපතිතුමා ලියා දැනුන්දුන්පසු මේ අන්තිමේදී කියාපු වැරැද්දක් දිගටම කෙරෙන්ට ඉඩහරින එක එක දවසට (එකදවසට වැඩිනම්) තවත් වැඩිමනත් රුපියල් 10ක දඩයක් ඒ අයට ගසනුලැබේ.

*ජලකම්මානතයට අයිති දියපාර ආදිය දූෂ්‍යවෙන අන්දමට යම් වැඩකට සම්බන්ධ ක්‍රියාවක්කලාට දඬුවම.*

30. (1) යම් වැඩක් කෙරෙන ස්ථානයක හිමියෙක් පදිංචිකාරයෙක්, කළමනාකාරයෙක්, ඒජන්ත කෙනෙක්, සුපරින්ටැන්ඩන්ට් කෙනෙක් ඒ වැඩ සම්බන්ධ ක්‍රියාවකින්, මොනම දියපාරක්, ජලාශයක්, දිය පෙට්ටියක්, ජලමගක්, ජලකම්මානතයට අයත් යම් කම්මානතයක් දූෂ්‍යකලාද දූෂ්‍යවෙනවෙනලෙස ක්‍රියා කලාද, ඔහු වරදක් කලාවේ, ඊට දඬුවශයෙන් 37වෙනි වගන්තියේ සඳහන්ලෙසත් ඇර මනත් වැඩිය නව රුපියල් 50ක දඩයකටද, සභාපතිතුමා විසින් අත්සන්කල දැන්වීමක් බාරදී ගතවෙන්නාවූ 24 පැය කට පසු, මේ වරදකරගන යන්නාවූ එක එක දවසට රුපියල් 25ක දඩයක්ද ගැසිය හැකිය.

*විභාගකර බලා තීන්දුවදීමට නල ඇරීමේදී යන වියදම ගැනයි.*

31. නල ඇර බැලුවිට ඒ නලවලින් නික්මෙන හෝ ඒවායේ තිබෙන යමකින් වතුර දූෂ්‍යවී තිබේනම්, විභාගයට ගිය වියහියදම් ඒ නල අයිතිකාරයාහෝ ඒවායේ කලමනා බලපුළුවන්කම්කරන අය විසින් ගෙවිය යුතුයි. විභාගයේදී එසේ නරක්වීමක් නොවීතිබෙන බව පෙනුනිනම් ඒ වියහියදම් සභාවදරන්නේය.

*පොලවේ සවිකරනලද දිය පෙට්ටිවල වතුර තබාගැනීමට ඉඩදිය නොහැකි බව.*

32. බිම වලලාපු හෝ පොලවේ හාරාපු දියපෙට්ටි සභාපතිතුමාගේ ලියවිල්ලකින් බලයක්ගෙන මිසක් ඒවා දියපිරවීමට පාවිච්චිකරන්ට බැරිය.

33. ඇතුළත ලෝහවැස්මක් නොමැති ලීපෙට්ටි ආදී භාජනයන්හි වතුර එකතුකර තබාගන්ට බැරිය.

*වතුර එකතුකර තැබීමට භාජන.*

34. සභාවට යුතුයයි සිතන පැය වේලාවලදී වතුර සැපයීම නැවැත්වීමට බලේතිබේ.

*වතුර නැවැත්වීමට සභාවට බලය තිබේ.*

35. නාගරිකයතුළට අයත් සෑම වතුර පාවිච්චිකරන්නෝම මීට යාකර තිබෙන ඈඩුල්පත්‍රයේ රෙකුලාසි පැවැත්විය යුතුයි. තවද මෙහි පහත සඳහන්වූ අදහස් සඳහා කලින්කලට යුතුවූ අමුතු රෙකුලාසි පැනවීමටද බලය තිබේ.

*රෙකුලාසි.*

(a) සභාවෙන් සපයන වතුර අපතේ හැරීම, වැරදිපාවිච්චිකෙරීම, ඕනෑවාට වඩා පාවිච්චිකෙරීම හෝ දූෂ්‍යකෙරීම වැලැක්වීමටය.

(b) නල, නලදෙඅර, ඇබ, වතුර පෙට්ටි, වතුර කාමර සහ වෙනත් උවමනා උපකරණ භාජනාදිය වතුර ගෙනයාම, දීම, රැස්කෙරීම යනාදියට, තරම, තත්වය, ශක්තිය, ද්‍රව්‍යය, සාදන විධිය, තබන ස්ථානය, වෙනස්කෙරීම්, අරන්දූම්ම්, අළුත්වැඩියාකෙරීම්, ආදිය නියම කෙරීමටය.

(c) ප්‍රසිඩ නාන ස්ථාන, සතුන් සහ රෙදි සෝදන ඉඩම්, තැබීමට, පැවැත්වීමට සහ නියමකෙරීම සඳහාය.

(b) වතුර කණු මාර්ගයෙන් ප්‍රසිඩ වතුර සැපයීම සහ පාවිච්චිය විධානකෙරීමටය.

(e) පුද්ගලික සැපයීම් සහ ඊට වුවමනා ද්‍රව්‍ය ආදි සවිකෙරීම් විධානකෙරීමටය.

(f) මීම්මෙන් වතුර සැපයීම විධානකෙරීම සහ ඊට වුවමනා මීම්, සවිකෙරීම් ආදි වුවමනා විධාන කෙරීමටය.

(g) ගෘහස්ථ ප්‍රයෝජනයට නුවූ වෙනත් ප්‍රයෝජනවලට වතුර සැපයීම සහ ඊට ගෙවියයුතු ගණන ආදී විධිවිධානයන් සඳහායි.

(h) සභාවට ඕනෑයයි පෙනියන වෙනම කොයි අදහස් සඳහා කරන සැපයීම් ගැන සහ විධිවිධාන කෙරීම් සඳහාය.

36. මොනම රෙකුලාසි නමුත් සභාව විසින් කලින්කලට වෙනස්කරන්ටද, අළුත්වැඩියාකරන්ටද, මකා දමන්ටද පුළුවන. තවද ඒ වෙනුවට තවත් රෙකුලාසි පැනවිය හැකිය. එසේකළ හැක්කේ මේ ප්‍රදේශයේ තිබෙන මොනම පනතකටවත් ඒ රෙකුලාසි විරුඞවිය නොහැකි සැටියට සහ තවද රෙකුලාසියක් කැඩීමේදී ගසන දඩය රුපියල් 50කට වැඩිවිය නොවිය යුතුවා සහ රෙකුලාසියක් කැඩුවාය කියා සභාපතිතැන ලියවිල්ල කින් දැනුම්දුන්නාට පසුව එන එක එක දවසකට රුපියල් 10කට වැඩිනුනොත් තමාය.

*රෙකුලාසි වෙනස්කිරීමට සභාවට බලේ තිබෙන බව.*

37. මොනම රෙකුලාසියක්වත්, වෙනස්කිරීමක්වත්, අළුත්කෙරීමක්වත්, මකාදැමීමක්වත් ඒ වෙනුවට අනිකක් දැමීමවත් ලංකේශ්වරයානන් විසින් ව්‍යවස්ථාදායක මන්ත්‍රන සභාවේදී ස්ථිරකරනතුරු බල නැත. එසේ ස්ථිරකෙරීමේ දැන්වීම ඒ ගැන කරනවා ඇත. තවද ඒ රෙකුලාසි ස්ථිරකර ආණ්ඩුවේ ගැසට්පත්‍රයේ ප්‍රසිඞකළ පසු මෙහි පනවනලද ලෙස වලංගුවා සහ බලය තිබේ.

*ලංකේශ්වරයානන් විසින් ව්‍යවස්ථාදායක මන්ත්‍රන සභාවේ සම්මතය ඇතුව රෙකුලාසි ස්ථිර කෙරීම.*

38. මේ සමග අමුනා තිබෙන ඈඩුල්පත්‍රයේ තිබෙන කොයිම රෙකුලාසියක් කඩකරන්නෙක් හෝ 35වෙනි සහ 36වෙනි වගන්තිවල සඳහන් කරුණු කඩකරන්නෙක් හෝ වරදකාරයා වේ. තවද 36වෙනි වගන්තියේ කියන ප්‍රකාර කඩකෙරීමක් දිගටම කරගන යෑමටත් යටත්ව රුපියල් 50කට වැඩිනුවූ දඩයකට යටත්ය. 35වෙනි සහ 36වෙනි වගන්තිවල රෙකුලාසි සැටියට නම් එහි කියා තිබෙන දඩය ප්‍රකාර දඩයක වත් යටත්ය.

*රෙකුලාසි කැඩුවාට දණ්ඩනය.*

39. ගේක හෝ ඉඩමක හිමියෙකුට හෝ පදිංචිකාරයෙකුට දැන්වීමක් බාරදෙන්ට වුවමනා වුනිනම් ගේ හිමියා හෝ පදිංචිකාරයා නමට ලියා එහි පදිංචිකාරයාට බාරදිය යුතුයි. නැත්නම් ඔහුගේ පවුලේ වැඩිවිය ගිය අයෙකුට හෝ වැඩකරුවෙකුට බාරදිය යුතුයි. එසේ දෙන්ට බැරිවුනිනම් පදිං කාරයෙක් නැත්නම් ඒ ගෙයි හෝ වත්තේ ගේ හෝ ඉඩමේ හොඳට පේන ස්ථානයක සවිකළ යුතුයි. එයාකාර දැන්වීමක ගේ හිමි යාගේ හෝ පදිංචිකාරයාගේ නම දැමීම උවමනා නැත. යම් ගේක, ගොඩනැගිල්ලක, ඉඩමක බදුබාරගත් තෙක් හෝ ඔහුගේ ඒජන්තතැන මේ රෙකුලාසිවල අදහසට එම ගෙයි හෝ ගොඩනැගිල්ලේ හෝ ඉඩමේ අයිතිකාරයා මෙන් බාරගනුලැබේ.

*දැන්වීම් භාරදීම.*

40. වෂී 1910යේ ආඥාපණතේ 243වෙනි වගන්තියේ ප්‍රකාර සහ මේ රෙකුලාසිවල ප්‍රකාරද සභාපති තුමා විසින් පැනුතු යම් බලද කළයුතු කෘත්‍යයන්ද එතුමා විසින් සාමාන්‍ය වසයෙන් හෝ විශෙෂවශයෙන් ලිය විල්ලකින් බලය දෙනුලැබූ කොයිම මුලාදැනියෙකුට නමුත් ඒ බල පාන්ට සහ කෘත්‍යයන් කරන්ට පුලුවන.

## ඈඩුල්.

1. ප්‍රසිඩ වතුර කානුවලින් දිය ගෙනියායුතුවන්නේ බාලි හෝ තවත් වෙන සෑහෙන උපකරණවලය, තවද කානුවට ගලායාමත්, අද්දරකට ගලායාමත්, මහපාරට හෝ අඩිපාරට ගලායාමත් වලක්වන අන්දමට ගෙනගියයුතුයි.

2. ප්‍රසිඩ වතුර කණුවකට රෙදිනල හෝ වෙන නලයක්වත් වෙන මොනාකාර උපකරනයක්වත් විකවේලාවකට හෝ සෑම වේලාවකට හෝ සවිකරන්ට බැරිය.

3. ප්‍රසිඩ වතුර කණුවකට යාකර තිබෙන ස්වකීය බලයෙන් වැහෙන නලදොරක් හෝ එයාකාර උපකරනයක් ඒකේ කරන ක්‍රියාව වැලැක්වීම හෝ බාධාකෙරීම තහනම්ය.

4. A පෝර්මයේ ප්‍රකාර නාගරික සභාව සමග පොරොන්දුවකට නොබැඳී පුද්ගලීක සැපයීමට දෙන වතුර වෙන මොනම වෙළඳමකටවත් කර්මාන්තයකටවත්, වැඩකටිවත්හරි, අලංකාරකෙරීම සඳහා හරි යනනුසූසනු අදහස්වලට හෝ බිමට වතුර දැමට හෝ ගැනීම තහනම්ය.

5. එකම මායිමේ එකම පදිංචියේ ඉඩමකට ජල කර්මාන්තය සමග යාකලහැක්කේ එකනලයක් පමනය.

6. මොනම නලයකින් හෝ මීම්මකින් හෝ, වෙන සවිකෙරීමකින් වතුර අපතේ යන්නේනම්, සභාපතිතුමාවිත් වතුර නැවැත්වියහැකිය. වැරැද්ද හරිගස්සනතුරු යාකෙරීම් කරන්නේ නැත.

7. එක ස්ථානේක තිබෙන නලයක් තවත් ස්ථානේක තිබෙන නලේකටවත්, දියපෙට්ටියකටවත් වෙනත් සවිකෙරීමකට වත් යාකරන්ට බැරිය.

8. ජලකර්මාන්ත සමග සම්බන්ධ පුද්ගලීක ස්ථානේක තිබෙන නල, නලදොර, මීම්, එවායේ මහත, තත්වය, තිබෙන අන්දම ආදී කරුණු සැටියට වතුර අපතේ යාම, වැරැදි පාවිච්චිය, ඕනෑවාට වඩා පාවිච්චිය, දූෂ්‍යකෙරීමාදියක් වේවිය කියා සෑහෙන කරුණු ඇතුව සභාපතිතුමාට හැඟිගියේනම්, තවද වතුර බෙදුදීමට විරුඞවෙනබව පෙනුනිනම්, එමගේ හිමියාට හෝ පදිංචි කාරයාට B පෝර්මේ ප්‍රකාර දැන්වීමක් ලියා වෙනස්කරන්ට ඕනෑ අන්දමද දන්වා එමවෙනස්කෙරීම් සභාපතිතුමාට හෝ ඔහු ගෙන් ලියා බලේලත් අයට සතුටුවෙනාකාර ගේහිමියා හෝ පදිංචිකාරයා එවලේම කරන්ට ඕනෑය. ගේහිමියාගේ හෝ පදිංචි කාරයාගේ නම හෝ පදිංචි ස්ථානය දන්නේ නැත්නම් එම දැන්වීම එම ඉඩමේ පෙනෙන ස්ථානේක සවිකල යුතුයි. ඊටපසු මේ රෙකුලාසිවල තේරුම ප්‍රකාර ඒ බාරදුන් බවට ගණන්ගනු ලැබේ.

9. සභාපතිතුමාගේ දැනුම්දීමේ ප්‍රකාර අභිනව සැපයීම් සහ දැනට තිබෙන ඒවා වෙනස්කෙරීමද කළයුතුයි. නලයේ පලල ප්‍රමාණය, එයදමන ක්‍රමය, දියමාරගේ ගෝමරය, මහත, අන්දම, සවිකරණ ස්ථානය, සැපයීම වෙනස්කෙරීම, සෑදීම යනාදී කරුණුද, හැකිතාමකින් පාවිච්චිකරන්නාගේ කැමැත්තට එකඟවද සිදුකෙරීමේ අයිතිවාසිකම සභාපතිතැනට තබාගන්නාය.

10. අභිනව සැපයීමක් තැනීම හෝ දැනට තිබෙන තැනීමක් වෙනස්කෙරීමක් හෝ දික්කෙරීමටද තිබෙන අදහස සභාපතිතැනට සභාපතිතුමාගේ කන්තෝරුවෙන් ලබාගතහැකි පෝර්මකොළයකලියා දැනුම්දිය යුතුයි. මේ දැනුම්දීම (f පෝර්මය ප්‍රකාරයි) සභාපතිතැනගේ නමට ලියා ඔහුගේ කන්තෝරුවට බාරදිය යුතුයි. මේ කොයිම වැඩක්වත් සභාපතිතැනගේ හෝ ඔහුගෙන් ලියාපු බලයක්ලත් අයගේ කැමැත්ත නැතුව කළනොහැකිය.

11. අභිනව සැපයීම්, හෝ වෙනස්කෙරීම්, හෝ තිබෙන එකක් අළුත්වැඩියාකෙරීම් සියල්ලම සභාපතිතුමාගේ සතුට ලෙස කළයුතුයි. හරියකියා නියමකරණලද නලආදිය සවිකෙරීම් පමණක් පාවිච්චිකලයුතුයි. සභාපතිතැනගේ කන්තෝරුවේදී මේවාගේ සැම්පල් බැලිය හැකිය.

12. සභාපතිතුමා විභාගකරබලා හොඳයි කියනතුරු කිසිම නලයක්වත්, නලදෙරක්වත්, වෙනසවිකෙරීමක්වත් වසන්ට බැරිය. මේවා විභාගකරබලා හොඳයයි ඒත්තුගත්පසු සභාපතිතුමා හෝ ඔහුගේ බලයලත් අය තක්සේරුකල වැඩ, උවමනා ද්‍රව්‍ය, යාකෙරීම් යනාදියේ ගාස්තුව, ඉල්ලුම්කාරයා විසින් නාගරික සභාවේ තැන්පත්කලයුතුයි. එවිට ජලකම්හත සමඟ ඉල්ලුම් කරනලද සැපයීම් යාකර සපයන්ට පටන්ගන්නවා ඇත. යාකෙරීම් කෙරීමට බලය ඇත්තේ සභාපතිතැනටයි. තවද ඉල්ලුම් කාරයාට D පෝර්මේ ප්‍රකාර ගණනක් සාදා දෙනවා ඇත. තැන්පත්කරණලද මුදලෙන් යමක් ඉතුරුව තිබේනම්, එයද දෙවනු දෙනුලැබේ. තක්සේරුවට වැඩිවියදමක් විතිබේනම්, එම මුදල ඉහතකී ගණන බාරදුන් කඩිනමින් ඉල්ලුම්කාරයා විසින් ගෙවිය යුතුයි.

13. සණකම පතුලක් ඇති වාත්තුකලයකඩ හච්චඇති හෝ පිත්තල කරාමයක් සැපයීම් නලයට සවිකලයුතුයි. වාත්තු කල යකඩෙන්නම් ජෙනුව වසනලද ඇසබැස්ටෝස් හෝ බුරුල් නලදෙරක් ඇති පහලට ඉස්කුරුප්පු කරකවන කරාමයක්විය යුතුයි. අඟල් දෙකකට වැඩි විෂ්කම්භය ඇති නලයක්නම් දියදෙරක් හෝ ලිස්සනාදෙරක් ඇතිවිය යුතුයි. කරාමය හෝ නලදෙර සවිකලයුත්තේ පඩියක් ඇතිනම් ඒකයට සහ පුලුවන් පමන ඉඩමට කිට්ටුය. සැමවේලේම ඇර බැලියහැකි අන්දමට ඊට වාත්තුකල යකඩ පියනක් ඇතිවිය යුතුයි.

14. විදිනලයේ සිට ඉඩමේ නලඇබය දක්වා සැපයීම් නලය නාගරික සභාවට අයිති දේපලවේ. සභාපතිතුමා විසින් ඒසේ අළුත්වැඩියාකෙරීම්ආදිය කලයුතුයි. යම් ඉඩමක නලඇබයකට අනතුරක් කලේනම් ගේහිමියාගේ හෝ පදිංචිකාරයාගේ වියදමෙන් සභාපතිතුමා විසින් කරවියයුතුයි. ඊට යන ගාස්තුව සභාවට ගෙවිය යුතුයි. මිට යුතු ගාස්තුව නොගෙවා හැරියේනම් ඒ ස්ථානේට වතුර සැපයීම නැවැත්වීමට සභාපතිතුමාට බලය තිබේ.

15. යම් ස්ථානේකට යම් කරුණක් සඳහා වතුර සැපයීම නැවැත්වූපසු ආයේමත් යාකෙරීමක් කරන්ට ඉල්ලුවොත් ගේ හිමියා හෝ පදිංචිකාරයා ඊට තක්සේරුකල මුදල කලින් සභාවට ගෙවියයුතුයි. ඉතුරු යමක් තිබුනොත් වැඩය හමාරවූ පසු එයද අයිතිකාරයාට දෙනවා ඇත. වැඩියගිය වියදමක් ඇද්ද එයද අයිතිකාරයා විසින් වැඩය හමාරවූ පසු සභාවට ගෙවියයුතුයි.

16. වතුර සැපයීම පිණිස සියළුම උවමනාවල් සභාව විසින් සම්පූර්ණකර දුන්නනමුත්, නලය පිපිරීමෙන් හෝ ගලායාමෙන් වෙන අලාභහානියකට සභාව වගකියන්ට බැඳිනැත. තවද විදිනලකදෙසිට ඉල්ළු ස්ථානය දක්වා තිබෙන නල ඇබයෙන් පිටස්තරව වගකීමකට සභාව මොනම අවසරදීමකටවත් ක්‍රියාවකටවත් බැඳිනැත.

17. වතුර සැපයීමේ සියළු නලම වාත්තුකල යකඩෙන් හෝ පනපොවාපු යකඩෙන් කරවා කිල් ගාවා හෝ ගැල්වනයිස් යකඩෙන් හෝ ඊයමෙන් කලයුතුයි.

18. පනපොවාපු යකඩෙන් කලනල "බෙස්ට්වෝමර් පයිපිං" නම් ජාතියෙන් වියයුතුවා සහ මෙහි පහත පෙනෙන බර ප්‍රකාරයි.

| ඇතුලත. | විෂ්කම්භය. | අඟල්. | දිග අඩි. | රාත්තල් | බරවියයුතුයි. |
|---|---|---|---|---|---|
| ,, | ,, | $\frac{3}{8}$ | 100 | 60 | ,, |
| ,, | ,, | $\frac{1}{2}$ | ,, | 98 | ,, |
| ,, | ,, | $\frac{3}{4}$ | ,, | 130 | ,, |
| ,, | ,, | 1 | ,, | 212 | ,, |
| ,, | ,, | $1\frac{1}{4}$ | ,, | 280 | ,, |
| ,, | ,, | $1\frac{1}{2}$ | ,, | 345 | ,, |
| ,, | ,, | 2 | ,, | 470 | ,, |

19. සියළුම ඊයම්නල සනවියයුතු සහ මෙහි පහත බරට අඩුවිය නොයුතුයි.

| ඇතුලත. | විෂ්කම්භය. | අඟල්. | දිග අඩි. | රාත්තල් | බරවියයුතුයි. |
|---|---|---|---|---|---|
| ,, | ,, | $\frac{3}{8}$ | 1 | 5 | ,, |
| ,, | ,, | $\frac{1}{2}$ | ,, | 7 | ,, |
| ,, | ,, | $\frac{3}{4}$ | ,, | 11 | ,, |
| ,, | ,, | 1 | ,, | 15 | ,, |
| ,, | ,, | $1\frac{1}{4}$ | ,, | 22 | ,, |
| ,, | ,, | $1\frac{1}{2}$ | ,, | 25 | ,, |

20. වාත්තුකල යකඩනල ඊයමෙන් සන්ධිකර කඹ ඔතන්ට ඕනෑය. පනපොවාපු යකඩ නල ඉස්කෘප්පු සන්ධිකර තව් වල දමන්ට ඕනෑය. ඊයම් නලවලට පාස්සාපු සන්ධි ඇතිවිය යුතුයි.

21. වතුර අහකට ඇදෙන නල "ස්කෘ ඩවුන්" යන වර්ගය වියයුතුයි. එසේ නැතහොත් සභාව විසින් පිලිගත් වෙන වර්ගයක් වියයුතුයි.

22. ජල කම්හතවලින් වතුර සපයන දිය පෙට්ටිවල නියමකවරන වර්ගයේ බරබෝලැති නලදෙර ඇතිවියයුතුයි. බෝල සහිත නලදෙර සෑදියයුතුවන්නේ වතුරපෙට්ටියේ වාටියෙන් අඟල් 2ක් පහලට වතුර ආව සැටියේ වැසෙන විදියටය.

23. සෑම පෙට්ටියේම සපයන නලය සවිකලයුත්තේ වතුරපෙට්ටියේ ජලමට්ටමට උඩින්ය.

24. පිටත ගලන නල සෑම පෙට්ටිවලින්ම ගෙයින් පිටතට ගෙනගියයුතුයි. කාන්දුවීමක් ආදිය බලාගතහැකි අන්දමට ගෙයින් පිට හොඳට පෙනෙන ස්ථානයක සවිකල යුතුයි. මේ කියනලද මොනමකරුනක් නිසාවත් කාණුවකට හෝ නාන කාමරේක වලක හෝ වෙන සනීපාරක්‍ෂක උපකරණයක් හා සමග යාකල නොයුතුයි. සෑම දියපෙට්ටිවලට වෙන්වෙන් වශයෙන් එක එකට පිටතට ගලන නලයක් තැබියයුතුයි.

25. සභාව විසින් පිලිගත් වර්ගයේ අපතේයාම වලක්වන සෝදන තාන්කි සෑම වතුර කාමර සමග සවිකලයුතුයි. මොනම කරුණක් නිසාවත් සැපයීමේ නල කකුස්තැටි, වැසිකිලි, මූත්‍රභාජන සමග යාකල නොයුතුයි. මේ සෑම ප්‍රස්තාවලදීම මේ අතරේ දියපෙට්ටියක් හෝ තාන්කියක් දූෂ්‍යවතුර හෝ දූෂ්‍ය වායුවක් සැපයීම් නලවලට හෝ විදිනලවලට නොඑනසැටියට සකස්කල යුතුයි.

26. අහකට වතුර ගලන නලයේ මාරය පෙනෙන නොවැසූ ස්ථානේක කාන්දුවීම පහසුවෙන් දැනගන්ට පිහිටිය යුතුයි. වතුර වැගිරෙන්ට තිබෙන දියපෙට්ටි තාන්කි හෝ මොනම භාජනයක්වත් මුදුන් ජල මට්ටමට පහළින් මේ කියන ලදමාරය නොතැබිය යුතුයි.

27. නගර සභාවේ විශෙෂ අනයක් නැතුව කොයිම සපයන නලයක්වත් බොයිලේරුවක්, වතුරම්දෙන භාජනයක් හෝ වෙනත් යන්ත්‍රයක් සමග සවිකලනොයුතුයි.

28. සෑම නාන තාන්කියක හෝ සෝදන භාජනයක හෝ බේසමක වතුර ඇතුල්වෙන මග, පිටවෙන මගට වෙන් කළයුතුයි. තවද ඇතුල්වෙන මග මේ කියන භාජනාදියට ඉහළින් වියයුතුයි.

29. ගෘහසථ ප්‍රයෝජනවලට හුවූ සියලූ සැපයීම් මිම්මේ ප්‍රකාරයටයි. සභාවේ කල්පනාවේ අන්දමට එසේ නොවිය හැක. නමුත් නියමයක් වශයෙන් සෑමවිටම මේ සැපයීම් මිම්මෙන් වියයුතුයි.

30. මෙහි පහත සඳහන්වෙන අදහස්වලට කරන්නාවූ සැපයීම සියල්ලම ගෘහසථ අදහස්වලට නොවූබවය, එනම් :—

(1) වතුර පාවිච්චිකරන්නාවූ මොනම කම්හතයකට හෝ වෙළඳමකට.
(2) හෝටලයකට, පුද්ගලික බෝර්ඩින් ගෙදරකට, රැස්වරොං එකකට, හෝ නවාතන් ගෙයකට.
(3) ප්‍රසිඬ නාන ඉඩමකට.
(4) විකිනීමට හෝ කුලියටදීමට තිබෙන අශවයන්ට, ගවයන්ට හෝ වාහනවලට.

වර්ෂ 1896යේ නෝම්බර 1කේ රෙකුලාසියේ යට රෙජිස්ටර්කරණලද කිරිදෙවින ස්ථානයක් මේ රෙකුලාසිවල 1වෙනි වගන්තියේ අදහසට යටත් නැතුවා සහ නිදහස්ය. යම්විටක මේ ස්ථානය රෙජිස්ටර්කරපූ කිරිදෙවින ස්ථානයක් මෙන් නැවතුනි නම් එසේ නැතුව එම ස්ථානය වෙන අදහසකට පාවිච්චිකරන බව නගර සභාවට හැඟීගියේනම් මේ නිදහස නිම වෙනවා ඇත.

31. එක් සම්බන්ධකරනලද බදුනොගෙවන හෝ ඒ වෙනුවෙන් නියම මුදලක් ගෙවන ස්ථානවලට ගැලොම් 1,000ට රුපියල් එක බැගින් මිම්මෙන් වතුර සැපයීමට සභාවට නිදහස තිබේ. තවද දැනට තිබෙන අයිතිවාසිකම් විශෙෂ අයිතිවාසිකම්වලට විරුඬ නොවන්නේනම් මිම්මක් නැතුව විශෙෂ පොරොන්දුවකට ඒ අයවල් සමග බැඳීමෙන් වතුර සපයනවා ඇත.

32. මිම්මක් සවිනොකර, මෙහි පහත සඳහන් අදහස් සඳහා සපයන වතුරට මෙහි පහත පෙනෙන ගාස්තු අත්පිට සභාවට ගෙවිය යුතුයි.

| | | කාර්තුවට. | අවුරුද්දට. |
|---|---|---|---|
| (1) මිදුල් හෝ වතුවලට වතුර දැමීමට | | | |
| පළමුවෙනි අක්කර බාගේට හෝ එයින් කොටසකට | ... ... | 4·50 | 18·00 |
| පළමු අක්කර බාගෙත් එකතුව එන අක්කර කාලට හෝ එයින් කොටසකට | ... | 1·50 | 6·00 |

(2) විකිනීමට හෝ කුලියට දීමට ගවයෝ, අශවයෝ, වාහන තිබෙන ස්ථානවලට වතුර සපයන්ට.

| | | මසකට රු. | ශ. |
|---|---|---|---|
| කරත්තේකට හෝ මෝටෝර් රතයකට | ... ... ... ... | 0 | 67 |
| රික්ෂෝ රතේකට | ... ... .. ... | 0 | 21 |
| අශ්වයෙකුට හෝ මිවූලෙකුට | ... ... ... .. | 0 | 84 |
| කොටළුවෙකුට | ... ... ... ... | 0 | 38 |
| ගොනෙකුට | ... ... ... ... | 0 | 34 |
| බයිකරත්තයකට | ... ... ... ... | 0 | 21 |

(3) මෙහි සඳහන් නොකරනලද කුලියට හෝ විකිනීමට තිබෙන අශවයින්, ගවයින්, වාහන ආදියට නියම ගණන් සභාව විසින් මේ ඉහත ගණන් ප්‍රමාණව නියමකරනවා ඇත.

(4) ගොඩනැගිලි සෑදීගන එක ස්ථානයකට මාසේකට එක වැඩකරුවාට ශත 25 බැගින් ගණනවය.

(5) බත්කඩ, පාන්ගෙවල් හෝ ගෘහසථ ප්‍රයෝජනවලට හුවූ වෙන පාවිච්චිවලට වතුර ගන්නා ස්ථානවලට එහි පාවිච්චි වෙන වතුරේ තරම බලා සභාව විසින් ගණන් නියමකරනවා ඇත.

(6) ප්‍රසිඬ නාන ස්ථානවලට වතුර සැපයීම, එහි තිබෙන එක බාලිකයට (බාලියකට ගැලොම් 80කට වැඩිවිය නොයිතුයි) කාර්තුවකට රුපියල් 14යි.

33. පුද්ගලික බෝර්ඩිං ගෙවල්වලට එහි සිටින එක අයෙකුට මාසේකට ශත 50ක් බැගින් ගෙවිකල වතුර සපයනවා ඇත.

34. ගෘහසථ පාවිච්චියට නොවූ පාවිච්චියකට විශෙෂ සවිකෙරීම්, ගොඩනැගීම්, උපකරනාදියක් (වතුනල තාන්කි, හුල් නල යනාදියයි) වතුර සැපයීමට දුන්නේනම් ගේ හිමියා විසින් හෝ එහි පදිංචිකාරයා මාරුවී වෙන අයෙක් ආවේනම් ඔහු විසින් ගෙවන සැටියටවත් නියමකල යුතුයි.

එසේ නැත්නම් ගේ හිමියාගේ වියදමෙන් සභාපතිතැනට සතුටු ගෙනදෙන අන්දමට ඒ සවිකෙරීම්, ගොඩනැගිලි, උපකරනාදිය අස්කළ යුතුයි.

35. දිය මැනීමට ගන්න මිම් සභාව විසින් සපයා සභාපතිතුමා විසින් ඒ ස්ථානවල සවිකල යුතුයි. තවද ඒවා නාගරික සභාවේ දේපල වේ.

36. වතුර සැපයීම ලබන්නාවූ ගෙයි හිමියා හො පදිංචිකාරයා විසින් මිම් සවිකරන එහි වැඩවලට, ද්‍රව්‍යවලට (මිම්ම ඇරයි) වැඩකරවීමට යන වියදම අත්පිට ගෙවිය යුතුයි.

37. සියලුම මිම් සභාවේ වියදමෙන් පවත්වනවා ඇත. කැමැත්තෙන් හෝ නොසැලකිල්ලෙන් කරනලද අනතුරු හැර වෙන කරන්නාවූ අළුත්වැඩියාකෙරීම් පාවිච්චිකරන්නාට සභාවේ වියදමෙන් කරදෙනුලැබේ. නමුත් ඕනෑකමෙන් හෝ නොසැලකිල්ලෙන් කරනලද අනතුරු අළුත්වැඩියාකෙරීමේදී යන වියදම ගේ හිමියාගේ හෝ බදුගෙවන්නා විසින් ගෙවිය යුතුයි.

38. මිම් පාවිච්චිකෙරීමේදී කාර්තුවකට හෝ කාර්තුවෙන් කොටසකට මෙහි සඳහන් බදු අත්පිට ගෙවිය යුතුයි. මේ කාර්තු පවත්ගන්නේ ජනවාරි 1වෙනිද, අප්‍රෙල් 1වෙනිද, ජූලැයි 1වෙනිද සහ ඔක්තෝබර් 1වෙනිදත්ය.

| | | | | | රු. | ශ. |
|---|---|---|---|---|---|---|
| අඟල් | 3නේ මිම්මක්, | කාර්තුවකට | හෝ එයින් කොටසකට | ... | 33 | 50 |
| ,, | 2කේ ,, | ,, | ,, | ... | 20 | 0 |
| ,, | 1½රේ ,, | ,, | ,, | ... | 14 | 4 |
| ,, | 1කේ ,, | ,, | ,, | ... | 8 | 0 |
| ,, | ¾රේ ,, | ,, | ,, | ... | 6 | 50 |
| ,, | ½ගේ ,, | ,, | ,, | ... | 5 | 50 |
| ,, | ⅜වේ ,, | ,, | ,, | ... | 4 | 50 |

39. මිම්වල ගණන්ගනුලබන්නේ සභාව විසින් නියමකල කාලවලටයි. එක්කාර්තුවකදී තුන්වතාවකට අඩුවියනොයුතුයි. ගණන බැලූ කොයිවේලාවකනමුත් ඒ සඳහන් සටහනක් "පදිංචිකාරයාටයි" කියා නම්කර ඒ ස්ථානේ තබාගන්නවාඇත.

40. කාර්තුවකට පාවිච්චිවූ ගණන බැලීමට මිම්මේ කියවීම්වල වෙනස ගනුලැබේ. පලමුවෙනි කියවීමනම්, ඒ කාර්තුවේ ලිතේ දිනවල 1වෙනිද සිට 10 දවසක් යන්ට ප්‍රථම බැළුගනනය. අලුත සවිකල මිම්මක්නම් පලමු දවසට බැළු ගනනයි. දෙවනු ගණන් කියවීමනම් කාර්තුව හමාරවෙන්ට 10 දිනකට ප්‍රථමයෙන් හෝ පසුව කරන්නාවූ ගණන් බැලීමය. මිම්ම අරන්දමා වතුරදීම නවතා තිබුනේනම් අන්තිමේට බැළුවාවූ ගණන දෙවනු ගණන් ගැනීමවේ. එම කාර්තුවේදි මිම් දෙකක් හෝ ඊට වැඩියෙන් පාවිච්චිකර තිබුනේනම්, එවිට කාර්තුවට පාවිච්චිකල වතුර ගණන ගන්නේ මිම්වල පෙන්නාසිටින ගනන් එකතුකෙරීමෙන්ය. තවද කොයිම කාර්තුවක නමුත් අන්තිම ගණන්ගැනීම ලෙසද ගන්නවානම්ය.

41. මීටරයක් නරක්වී තිබේනම් හෝ සෑදීමට හෝ වෙනස්කෙරීම සඳහා ගෙනගොස් තිබුනේනම් 39වෙනි වගන්තියේ සඳහන් සටහනේ ඒ බව සඳහන්කළ යුතුයි. අළුත් මීටරයක් සවිකෙරීමේදී හෝ පරන මීටරයක් ආයෙම දැමීමේදී තව සටහනක් ඒ ස්ථානේ දමාගිය යුතුයි. මීටරය හොඳින් තිබෙද්දී ගත් ගණන්ගැනීම් දෙකක් අතරේ කියවීමෙන් මීටරනැති දවස්වල සැපයූ වතුර ප්‍රමානය සාමාන්‍යවශයෙන් බලා ගණන්ගත යුතුයි.

42. පාවිච්චිකරන්නා මීටරයේ හරිකම ගැන අනුමාන කරන්නේනම් එවිට ඔහුගේ ඉල්ලීම පිට සභාපතිතුමා හෝ ඔහු ගෙන් බලයලත් අය විසින් එය සෝදිසිකර බලනවා ඇත. පාවිච්චිකරන්නා ඒ සෝදිසි වේලාවේදී ඉදිරිපිට ඉන්ට පුළුවන. මේ සෝදිසියෙන් එන එලෝදයට සභාපතිතුමා සහ පාවිච්චිකරන්නා බැඳිලාය 40වෙනි වගන්තියේ ප්‍රකාර මේ විභාගයට පසු ඒ කාර්තුවට අයත් වතුර ප්‍රමානය හරිගස්සවනුලැබේ. සෝදිසියෙන් පසු මීටරය හරිබව දැනගතිනම් හෝ ටිකබව පෙන්වනවා දැනගතිනම්, ඒ සෝදිසිකිරීම ඉල්ලූ අය විසින් සෝදිසිය සඳහා නගර සභාවට රුපියල් 20ක් ගෙවිය යුතුයි.

43. මේ ඉහත ජේන රෙගුලාසි අන්දමට ඒ කාර්තුවට පාවිච්චිකල වතුර ප්‍රමානය සහ වටිනාකම ගණන්ගන්නවා ඇත. යම් ඉඩමක් පදිංචිය සඳහා පාවිච්චිකරනවානම් 1910යේ නොම්බර 6යේ ආඥාපනතේ ප්‍රකාර අවුරුද්දේ වටිනාකමින් සියයට $\frac{3}{4}$කට සමානවන ගණනක් එම මුදලෙන් අඩුකරනවා ඇත. නැව්වලට වතුර සැපයීම ඇර වෙන අනිත් කොයිම සැපයීමකටත් එම ආඥාපණතේ ප්‍රකාර අවුරුද්දකට එන වටිනාකමින් සියයට $\frac{3}{4}$කට සමාන ගණනක් එම මුදලෙන් අඩුකරනවා ඇත. එම කාර්තුවක ගණන් එම කාර්තුවට අන්තිමය. අනිත් කාර්තුවට එයින් ඉතුරුවක් ගෙනයන්ට නුපුළුවන.

44. ගෘහස්ථ ප්‍රයෝජනනුවූ සෑම සැපයීම්වලදී ඉස්සරහට පසුවූන කාර්තුවේ මුදල් ගණන කාර්තුවෙන් කාර්තුවට ගණන් දියයුතුයි.

E පෝර්මයේ ප්‍රකාර ගණන දියයුතුයි. මේ ගණනදී පසළොස්දිනක් ඇතුළත නගර සභාවට ඒ ගණන මුදලින් ගෙවිය යුතුයි.

45. මීටරයක් සවිකරතිබෙන කල ඒ මීටරයට බදු වශයෙන් කාර්තුවෙන් කාර්තුවට අත්පිට ඒ ගණන දියයුතුයි. ගණන දෙන්නේ F පෝර්මයේ ප්‍රකාරයි. ගණනදී පසළොස් දිනක් තුළ නගර සභාවට ඒ ගණන මුදලින් භාරදියයුතුයි.

46. ගින්නක්ගත් විටකහැර හෝ නගර සභාපතිතුමාගේ ලියාපූ කැමැත්තක් නැතුව හෝ ජලකම්‍ානතවලින් කිසිම වතුරක් (ප්‍රසිඩ ජලමල් හෝ ගෙවල්වලට දාපූ සැපයීම් හැරයි) ගැනීම තහනම්ය.

47. මේ රෙගුලාසි යට ගෙවන සෑම මුදල්ම ජලකම්‍ාන්තවල ගණනට "මීටර් ගණන" යන්න යට දැමිය යුතුයි. මේ රෙගුලාසිවල කියනලද දේ කෙරීමේදී දරන්නාවූ වියදම් සියල්ල සභාපතිතුමා විසින් එම ගණනෙන්ම අයකළ යුතුයි.

A,—පෝර්මය.

ගෘහස්ථ ප්‍රයෝජනයට සුදුසුනුවූ මීටරයෙන් වතුර සැපයීම සඳහා (මින්පසු අයිතිකාරයායි නම්කරණලද) ———— අය එක් පාර්ශවයක්ද නාගරික සභාව අනිත් පාර්ශවයක්ද අතරේ බැඳෙන්නාවූ ගිවිසුම් පොරොන්දුවයි.

2. මේ ඉහත කියනලද ස්ථානයට ———— ගෘහස්ථ ප්‍රයෝජනයට නුවූ පාවිච්චිය සඳහා එනම් (a), (b), (c) යනාදි යට වතුර සැපයීමක් දීම උදෙසා මෙහි පහත සඳහන් කොන්දේසි පිළිපැදීමට අයිතිකාරයා මෙයින් ගිවිසුම් පොරොන්දුවකට බැඳෙන්නේය.

(a) වතුර අඟල් ———— ක මීටරයකින් සපයා දියයුතුයි.

(b) ———— මීටරයට බදු වශයෙන් නගර සභාවට අත්පිට කාර්තුවකට රුපියල් ———— ගෙවීම හෝ ගෙවීම සැලැස්වීම අයිතිකාරයා කළයුතුයි.

(c) සෑම මාසෙකටම සපයන වතුරට ගැලොම් 1,000ට රුපියල් ———— ගාල්ලේ නගර සභාවට ගෙවීම හෝ ගෙවීම සැලැස්වීම අයිතිකාරයා කලයුතුයි. පලමුවෙනි ගෙවීල්ල කලයුත්තේ ———— මාසේ පළමුවෙනි දිනය.

3. මීටරයට ගෙවියයුතු ගාස්තුව හෝ වතුරට ගෙවියයුතු මුදල ගෙවන්ට නියම දින සිට 15 දිනක් තුළදී නගර සභාවට ගෙවවේ නැතිනම් වතුර පාවිච්චියට තිබෙන අයිතිවාසිකම් එසේකල අය අහිමිකරගන්නේය. තවද නගර සභාව විසින් වතුර සැපයීමද නවත්වනවා ඇත.

4. 1907තේ නොම්බර 18වේ ආඥාපණතේ නියෝග සහ වෂී 1910යේ නොම්බර 6යේ ආඥාපණතේ 110 (4) වගන්තියටතේ සෑදූ රෙගුලාසිත් මේ ගිවිසුම් පොරොන්දුවේ කොටසක් හැටියට භාරගනුලැබේ. තවද මේ කියනලද ආඥාපණතේ 110 (4) වගන්තියට මින්පසු සාදනුලබන කොයිම් රෙගුලාසිවලටත් මේ ගිවිසුම් පොරොන්දුවට අයත් දෙපාර්ශවයම බැඳිලාය.

5. එක් පාර්ශවයක් අනිත් පාර්ශවයට එය නිශ්චයකර ගැනීමට අදහස් තිබෙන බව ———— දවසක දැනුම්දීමෙන් මේ ගිවිසුමේ පොරොන්දු නිශ්චයකරගනු ලැබේ. මෙසේ නිශ්චය කරගත් පසු ගේ හිමියාටවත් පදිංචිකාරයාටවත් තවත් අභිනව ගිවිසුම් පොරොන්දුව නිශ්චයකරගත් පසු ගේහිමියාටවත් පදිංචිකාරයාටවත් තවත් අභිනව ගිවිසුමේ පොරොන්දුවක් කරණතුරු වතුර පාවිච්චියට ගැනීමට අයිතිවාසිකමක් නැත.

A පෝර්මය.

6. අලුතු පදිංචිකාරයෙක් එන්ට තිබෙන වග අයිතිකාරයා නියමලෙස සභාවට දැනුම්දිය යුතුයි. මේ ඉහත සඳහන් කොන්දේසි පැවැත්වීමට ලියවිල්ලකින් ගිවිසුම් පොරොන්දුවකට බැඳෙනතුරු කිසිම පදිංචිකාරයෙකුට වතුර පාවිච්චිකෙරීමට අයිතිවාසිකමක් නැත.

වෂී 191—ක්වූ————දින අතහන්කළේ ගාල්ලේදීය.

අතහන්වලට සාක්ෂි.

(1) ————

———— අයිතිකාරයා.

(2) ————

———— සභාපතිතැන.

මේ ඉහත පෙනෙන පොරොන්දුවල කරුනු පැවැත්වීමට මමත් පොරොන්දුවෙමි.

වෂී 191—ක්වූ————දින අතහන්කළේ ගාල්ලේදීය.

අතහන්වලට සාක්ෂි.

(1) ————

(2) ————

———— පදිංචිකාරයා.

B පෝර්මය.

නගර සභාව.

වෂී 191—ක්වූ————දින ගාල්ලේදීය.

සාවද්‍ය වතුර සැපයීමක් වෙනස්කෙරීමේ දැන්වීම.

————වීදියේ නොම්බර——ගෙයි හිමියාට හෝ පදිංචිකාරයාටයි.

මෙහි ඉහත සඳහන් ස්ථානයට වතුර සැපයීමේ යම් වැරැද්දක් තිබෙන බව සෝදිසි කෙරීමෙන් දැනගත් බව මෙයින් දැනුම් දෙමි. මේ සමග එවන සටහන් පතේ සඳහන් කරන්ට යුතුයයි මම විසින් සහතිකකරපු රෙපෙයාරුකෙරීම් හෝ වෙනස් කෙරීම නුඹ විසින් කරවිය යුතුයි. මේ දැන්වීම ලැබී දවස්————ඇතුළත මේ රෙපෙයාරුකෙරීම් හෝ වෙනස්කෙරීම් උඹ නොකර පැහැර හැරියේනම්, ජලකම්‍ානතවලින් නුඹට කරන්නාවූ සැපයීම් අත්සිටුවනවා ඇත. තවද මගේ අදහසට යුතුයයි හැඟියන අන්දමට එම රෙපෙයාරුකෙරීම්, වෙනස්කෙරීම් හෝ අළුත්කෙරීම් කරනතුරු වතුර සැපයීම දෙනුනොලැබේ.

————
සභාපතිතුමා

C පෝර්මය.

——— සැපයීමක් තැනවීමට, හෝ තිබෙන සැපයීමක් වෙනස්කරන්ට හෝ දික්කරන්ට අදහස තිබෙන බව දැනුම්දීමයි.

නොම්මර ———

ගාල්ලේ නගරසභාවේ සභාපතිතුමාටයි.

මේ පහත සැඹුල් එකේ සඳහන් ප්‍රකාර අළුත් සැපයීමක් තැනීමට, හෝ වෙනස් කෙරීමට, හෝ දිගී කෙරීමට අදහසක් තිබෙන බව මෙයින් දැනුම්දෙමි.

ගෙයි නොම්මරය ———
වීදිය ———
කොට්ඨාශය ———
බදුකාරයෙක් විසින් නම් අවුරුද්දට ගෙවන කුලිය රුපියල් ———
ගේ හිමියා පදිංචි නම්, ගෙයි අවුරුද්දකට වටිනාකම රුපියල් ———
දැනට තිබෙන ජල සැපයීමේ ප්‍රමාණය ———
දැනට තිබෙන නල කටවල ගණන සහ මහත ———
මොන අදහසකට වතුර ඕනෑද යන බව ———
ගෘහස්ථ ප්‍රයෝජනයටද නැත්නම් මොන ප්‍රයෝජනයටද ———
ගෙය හෝ ස්ථානය කුමන අදහසකට පාවිච්චිකරනවාද යන වග ———

කරන්ට අදහස්කරපු කර්මාන්තයේ විස්තර.

| පුද්ගලික ස්ථානවලට නල | | නල කටවල් (Taps) | | | වතුර පෙට්ටි Cisterns | | |
|---|---|---|---|---|---|---|---|
| දිග | මහත | නොම්මරය | ස්ථානය | මහත | පරිමාණය | ස්ථානය | කියයුතු කරුණු |
| | | | | | ඝන අඩි | | |

අයිතිකාරයාගේ අත්සන ———
පදිංචිකාරයාගේ අත්සන ———
අයිතිකාරයාට ලියුම් එවන විදිය.

---

නොම්මර ———

D පෝර්මය.

නාගරික කන්තෝරුවේදීය.
වර්ෂ 19 —— ක්වූ ——— දින ගාල්ලේදීය.

නගර සභාවේ ගණන් සමගයි.

| දිනය | කර්මාන්තවල විස්තරය | රු. | ශ. |
|---|---|---|---|
| | වතුර සැපයීමට උවමනාවේද් සැපයීමට සහ ——— වීදියේ නොම්මර ——— ගෙට මීටරයක් සවිකෙරීමට ... ... ... .. | | |
| | ඉහත කී කාරනා සඳහා වැඩ කුලී සහ වැඩබැලීමේ ගාස්තු ... ... | | |
| | මුළු ගණන ... | | |
| | මෙහි තැන්පත්කර තිබෙන මුදල ... ... ... | | |
| | ඉතුරුව යන්ට ඕනෑ මුදල ... ... ... ... | | |

අත්සන්කලේ ———
නගරසභාපතිතුමා.

---

